# ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් රාජ්‍ය නොවන සංවිධානවල බලපෑම

ඩබ්. එම්. සරසි ඡායා බණ්ඩාර
sarasichaya1@gmail.com

නූතන ජාතික රාජ්‍යයන් සංවර්ධනය මූලික කරගත් අරමුණු රාශියක් තුළ කටයුතු කරනු ලැබුව ද ක්‍රියාකාරීත්වයේ දී සියලු ම අංශයන් කෙරෙහි දායකත්වය දැක්වීම රාජ්‍යයට තරමක් අපහසු කාර්යයක් වී ඇත. රාජ්‍යයක සංවර්ධන ක්‍රියාවලිය තුළ රාජ්‍ය හා අත්වැල් බැද ගනිමින් ආයතන රාශියක් ක්‍රියාත්මක වන අතර ඒ අතරින් රාජ්‍ය නොවන සංවිධාන ප්‍රධාන වේ. යම් රටක ජාතික ආරක්ෂාවට රාජ්‍ය නොවන සංවිධාන සිදු කරන බලපෑම අද වන විට බොහෝ විවාදයන්ට ලක්වූවකි. ජාතික ආරක්ෂාව යනු දේශපාලන ලෝකයේ අතිශය සංවේදී විෂය පථයක් වේ. ජාතික ආරක්ෂාව රටක හද ගැස්ම හා සමාන බව බොහෝ දේශපාලන විචාරකයින්ගේ මතයයි. මෙම පර්යේෂණය තුළින් ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂාව කෙරෙහි රාජ්‍ය නොවන සංවිධානවල බලපෑම සම්බන්ධයෙන් 2001 පෙබරවාරි සිට 2009 මැයි දක්වා කාල පරාසය ඇසුරින් අධ්‍යයනය සිදු කර ඇත. ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන රාජ්‍ය නොවන සංවිධාන ජාතික ආරක්ෂාව සම්බන්ධයන් කුමන බලපෑමක් සිදුකර තිබේදැයි යන්න අධ්‍යයනය කිරීම මෙහි අධ්‍යයන ගැටලුවයි. පර්යේෂණ උපන්‍යාසය ලෙස රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ රාජ්‍ය තුළ නිසි පාලනයක් නොමැති වීම හේතුවෙන් ඒවා ජාතික ආරක්ෂාවට තර්ජනයක් වන බව සහ උතුරු නැගෙනහිර පැවති ගැටුම්කාරී වාතාවරණය තුළ රාජ්‍ය නොවන සංවිධාන එල්.ටී.ටී.ඊ සංවිධානයට පක්ෂපාතී ලෙස හැසිරී ඇති බවත්ය. මෙම පර්යේෂණය සඳහා ප්‍රධාන වශයෙන් ප්‍රාථමික දත්ත සහ ද්වීතියික දත්ත යොදා ගන්නා අතර ද්වීතියික දත්ත කෙරෙහි වැඩි අවධානයක් යොමු කෙරේ. ප්‍රාථමික දත්ත ප්‍රධාන ලෙසම දේශපාලනය පිලිබඳ විධිමත් අවබෝධයක් සහිත විද්වතුන්ගෙන් සාකච්ඡාමය මාර්ගයෙන් තොරතුරු ලබා ගැනීම සිදු කරනු ලැබේ. ද්විතියික දත්ත ලෙස අධ්‍යයන මාතෘකාවට අදාළ ලිපි ලේඛණ, සඟරා, පුවත්පත් සහ අන්තර්ජාලය භාවිතයෙන් තොරතුරු ලබා ගැනීම සිදු කරනු ලැබේ. මෙම අධ්‍යයනය තුළින් බොහෝ දේශීය විදේශීය රාජ්‍ය නොවන සංවිධාන මුඛ්‍ය පරමාර්ථයන් ඉවත දමා කටයුතු කරුණු ලබන ආකාරය හඳුනා ගත හැකි වේ. ඒවායේ ක්‍රියාකාරීත්වය විවිධ අංශ ඔස්සේ විවිධ ප්‍රමාණවලින් ශ්‍රී ලංකාවේ ස්වෛරීත්වයට හානිකර අන්දමින් මතුවෙමින් පැවති බවත් ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් වන නීති රීතිවල පවත්නා දුර්වලතාවයන් හේතුවෙන් ජාත්‍යන්තර වශයෙන් ක්‍රියාත්මක වන රාජ්‍ය නොවන සංවිධාන බොහෝමයක් ජාතික ආරක්ෂාව විෂයෙහි බලපෑම් සහගත අයුරින් හැසිරී ඇති බවත් ය. මේ තත්ත්වය සමනය කර ගැනීමට රාජ්‍ය නොවන සංවිධාන නියාමනය කිරීමේ සිට අදාළ යෝජනා ගෙන ආ යුතුය.

**මුඛ්‍ය පදඃ** ජාත්‍යන්තර; ජාතික ආරක්ෂාව; දේශීය; නියාමනය; රාජ්‍ය නොවන සංවිධාන